සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

21 | S | I

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

## First Term Test - Grade 12 - 2019

විභාග අංකය ............................ ආර්ථික විද්‍යාව I කාලය පැය දෙකයි

- ❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- ❖ **නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න. (පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)**

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් යථානුරූපී ප්‍රකාශයක් වන්නේ,
    1. අසීමිත මිනිස් වුවමනා සපුරාගැනීමට සමාජය සතු සම්පත් සීමිතය.
    2. ආදායම් අසමාන ලෙස බෙදීයාම අසාධාරණවේ
    3. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා විදේශාධාර ලබාගත යුතුවේ.
    4. රටක සැම පුරවැසියකුටම සමාන ආදායමක් හිමිවීම අවශ්‍ය වේ.
    5. ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය 10% ක මට්ටමේ පවත්වාගත යුතුය.

02. පහත දැක්වෙන සංකල්ප තුලින් සාර්ව ආර්ථික විද්‍යාත්මක සංකල්පය වනුයේ,
    1. ආන්තික පිරිවැය 2. ආයතනයක නිෂ්පාදන පිරිවැය 3. සේවා නියුක්තිය
    4. යම් භාණ්ඩයක ඉල්ලුම 5. සම්පත් හිගකම

03. නිෂ්පාදන සාධකයක් වශයෙන් ප්‍රාග්ධනයට උදාහරණයක් වනුයේ,
    1. ස්වාභාවික වනාන්තරයක් 2. පොස්පේට් නිධියක්
    3. බැංකුවකින් ලබාගත් ණය මුදලක් 4. තේ වගාවක්
    5. රුපියල් 1000 ක මුදල් නෝට්ටුවක්

04. ආර්ථික සම්පත් යනුවෙන් අදහස් වනුයේ,
    1. නිෂ්පාදන සම්පත් අතුරින් සීමිත සැපයුමක් ඇති හිග සම්පත්ය.
    2. මිනිසා විසින් නිෂ්පාදනය කරන ලද සියලුම සම්පත්ය.
    3. නිෂ්පාදනය නොකළ අසීමිත සැපයුමක් ඇති සම්පත්ය.
    4. නිෂ්පාදනයක් සමඟ ආවස්ථික පිරිවැයක් හට නොගන්නා සම්පත්ය.
    5. ශුන්‍ය මිලකදී අසීමිත සැපයුමක් සහිත නිෂ්පාදන සම්පත්ය.

05. පහත දැක්වෙන දෑ අතුරින් ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පතකට නිදසුනක් වන්නේ,
    1. වගාකළ ඉඩම්ය 2. යන්ත්‍ර සූත්‍රය 3. ඛනිජ තෙල්ය
    4. ඩොලමයිට්ය 5. සාගර මත්ස්‍ය සම්පත්ය

06. සමාජ පොදු කාර්ය ප්‍රාග්ධනය සඳහා උදාහරණයක් වන්නේ,
    1. වරාය සහ ගුවන් තොටුපොල 2. කුණු කසල ඉවත් කිරීමේ නල පද්ධති
    3. වාරි මාර්ග පද්ධති 4. මහා මාර්ග පද්ධති
    5. ජල සම්පාදන ක්‍රම

07. කුමක් කොපමණ නිපදවනවාද යන ප්‍රශ්නය,
1. සම්පත් බෙදා වෙන්කිරීමේ ප්‍රශ්නය ලෙස හැඳින්වේ.
2. නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය ලෙස හැඳින්වේ.
3. ආදායම් බෙදීයාමේ ප්‍රශ්නය ලෙස හැඳින්වේ.
4. නිෂ්පාදනයේ කාර්යක්ෂමතා ප්‍රශ්නය ලෙස හැඳින්වේ.
5. නිෂ්පාදන ක්‍රම ශිල්ප පිළිබඳ ප්‍රශ්නය ලෙස හැඳින්වේ.

08. සෑම රටකටම පොදු වූ මූලික ආර්ථික ප්‍රශ්නය වන්නේ,
1. විශාල මුදල් ප්‍රමාණයක් සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹායාමයි.
2. අසීමිත වුවමනා සපුරාලීමට සම්පත් හිඟකම බාධාවක් වීමයි.
3. හිඟ ස්වභාවික සම්පත් අධි උපයෝජනයට පාත්‍ර වීමයි.
4. නිෂ්පාදනය නිසා පරිසරය දූෂණය වීමයි.
5. දිළිඳුකම හෙවත් දරිද්‍රතාව විසඳාගත නොහැකි වීමයි.

09. වෙළෙඳපොළ ආර්ථිකයක මූලික ලක්ෂණයක් වන්නේ,
1. දේපොල පිළිබඳ රාජ්‍ය හිමිකම
2. සැලසුම් ක්‍රියාවලිය මත කටයුතු කිරීම
3. සමාජ ශුභ සාධනය මත කටයුතු කිරීම
4. දේපොල පිළිබඳ පෞද්ගලික හිමිකම
5. ආණ්ඩුවේ කාර්යභාරය සීමා රහිත වීම

10. වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් තුළ සමාජ සාධාරණත්වය සඳහා රජය මැදිහත්වන ආර්ථික,
1. සැළසුම් ආර්ථික නමින් හඳුන්වයි.
2. සමාජීය වෙළෙඳපොළ ආර්ථික නමින් හඳුන්වයි.
3. සමාජවාදී වෙළෙඳපොල ආර්ථික නමින් හඳුන්වයි
4. ධනේශ්වර ආර්ථික පද්ධති නමින් හඳුන්වයි.
5. ධනවාදී ආර්ථික පද්ධති නමින් හඳුන්වයි.

11. වෙළඳපොල ආර්ථිකයක මිලෙහි ප්‍රධාන කාර්යය වනුයේ,
1. ව්‍යවසායකයන් සඳහා ලාභ ජනනය කිරීමයි.
2. ඉල්ලුම සහ සැපයුම තීරණය කිරීමයි.
3. හිඟ සම්පත් විකල්ප අතර බෙදා වෙන් කිරීමයි.
4. ආදායම් ව්‍යාප්තිය උසස් කරලීමයි.
5. භාණ්ඩවල මිල නියම කිරීමයි.

12. වෙළෙඳපොළ ආර්ථිකයකට වඩා මධ්‍යගත සැලසුම් ආර්ථික පද්ධතියක් තුළ දක්නට ලැබෙන්නේ,
1. පාරිභෝගික ස්වාධිපත්‍යයන් පැවතීමය.
2. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවක් පැවතීමය.
3. තරගකාරිත්වයක් පැවතීමය.
4. පෞද්ගලික ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමය.
5. ආදායම් ව්‍යාප්තියේ සාධාරණත්වයක් පැවතීමය.

13. ආර්ථික පද්ධතියක කාර්ය සාධනය ඇගයීමේ නිර්ණායකයක් **නොවන්නේ**,
1. ආර්ථික නව්‍යකරණය
2. බාහිර ස්වායිතාව
3. සාධාරණ ආදායම් ව්‍යාප්තිය
4. ආර්ථික නිදහස
5. පූර්ණ සේවා නියුක්තිය


14. නිෂ්පදාන සම්පත්වල හිමිකරිත්වය හා දේපොල අයිතිය යන නිර්ණායක මත පදනම්ව බිහිවන ආර්ථික පද්ධති වන්නේ,
1. වෙළඳපොල ආර්ථික පද්ධති සහ විධාන ආර්ථික පද්ධති
2. ධනවාදී ආර්ථික පද්ධති සහ මිශ්‍ර ආර්ථික පද්ධති
3. ධනේශ්වර ආර්ථික පද්ධති හා සමාජවාදී ආර්ථික පද්ධති
4. සමාජයීය වෙළෙඳපොල සහ සමාජවාදී ආර්ථික පද්ධති
5. සැලසුම් ආර්ථික පද්ධති හා මිශ්‍ර ආර්ථික පද්ධති.

15. ''භාණ්ඩ'' යන්න ආර්ථික විද්‍යාඥයෝ නිර්වචනය කරනුයේ,
   1. ආවස්ථික පිරිවැයක් සහිතව සම්පාදනය කරන දෑ යනුවෙනි.
   2. ශුන්‍ය මිලකදී වුවද අසීමිත සැපයුමක් ඇති දෑ යනුවෙනි.
   3. නිෂ්පාදනය වැඩි කිරීමේදී ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් වැඩිවන දෑ යනුවෙනි.
   4. උපයෝගීතාවයක් හෙවත් ධන තෘප්තියක් ලබාදෙන දෑ යනුවෙනි.
   5. නිෂ්පාදනය කිරීමේදී ආවස්ථික පිරිවැය ශුන්‍ය වන දෑ යනුවෙනි.

16. ආර්ථික පරිසරයක් තුළ කටයුතු කරන පුද්ගලයකු නිවැරදි ආර්ථික තේරීමකදී ආර්ථික විද්‍යානුකූලව සලකා බැලිය යුත්තේ එම තීරණයෙහි,
   1. ආන්තික පිරිවැය ආන්තික ප්‍රතිලාභ වලට සමාන වන විටදීය.
   2. ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැය ඉක්මවන විටදීය.
   3. ආන්තික පිරිවැය ආන්තික ප්‍රතිලාභ ඉක්මවන විටදීය.
   4. ආන්තික පිරිවැය ශුන්‍ය වන විටදීය.
   5. තේරීමේදී ආවස්ථික පිරිවැයක් හට ගන්නා විටදීය.


17. X සහ Y භාණ්ඩ දෙකක් නිපදවන නිෂ්පාදන හැකියා වක්‍රයක් උපකල්පනය කරන්න. එහි නිෂ්පාදන වක්‍රය දිගේ පහළට යනවිට,
   1. ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් වැඩිවේ.
   2. ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් අඩුවේ.
   3. ආවස්ථික පිරිවැය ස්ථාවරව පවතී.
   4. එක් භාණ්ඩයක නිෂ්පාදනය පහළ බසී.
   5. ආවස්ථික පිරිවැය ශුන්‍ය වේ.

18. පහත දැක්වෙන නිෂ්පාදන හැකියා වක්‍රය සැලකිල්ලට ගන්න.




මෙම ආර්ථිකය ඉහළ ආර්ථික වෘද්ධියක් අපේක්ෂා කරන්නේ නම්,
   1. C ලක්ෂ්‍යය නිෂ්පාදනයට තෝරාගත යුතුය.
   2. B සිට C ලක්ෂ්‍යය දක්වා නිෂ්පාදනය මාරුකළ යුතුය.
   3. A ලක්ෂ්‍ය නිෂ්පාදනයට තෝරාගත යුතුය.
   4. D සිට B දක්වා නිෂ්පාදනය මාරුකළ යුතුය.
   5. B සිට E දක්වා නිෂ්පාදනය මාරුකළ යුතුය.

19. පහත රූප සටහනේ දැක්වෙන්නේ කිසියම් ආර්ථිකයක් තම තෝරා ගැනීම වෙනස් කිරීමට තීරණය කර ඇති ආකාරයයි.




මෙම වෙනස් කිරීම මගින් ආර්ථිකයට ඇතිවිය හැකි ප්‍රතිවිපාකයක් නොවන්නේ,
   1. ආර්ථික වෘද්ධි වේගය සීඝ්‍රයෙන් ඉහළ යයි.
   2. ආර්ථික වෘද්ධි ඉතා මන්දගාමීව ඉහළයයි.
   3. වර්තමාන පාරිභෝජන මට්ටම පහළ යයි.
   4. අනාගත පාරිභෝජන මට්ටම ඉහළයයි.
   5. ආයෝජනය වෙනුවෙන් පාරිභෝජනය කැප කිරීමට සිදුවේ.

20. ආර්ථික පසුබෑසීමක් නිෂ්පාදන හැකියා වක්‍රයක පෙන්නුම් කරනුයේ,
   1. නිෂ්පාදන හැකියා වක්‍රය වමට විතැන් කිරීම මගිනි
   2. නිෂ්පාදන හැකියා වක්‍රයේ වම්පස පිහිටි ලක්ෂ්‍යයක් මගිනි.
   3. වක්‍රය දිගේ ඉහළට ගමන් කිරීමක් මගිනි.
   4. නිෂ්පාදන ස්ථානය වක්‍රය දෙස සිට මුල ලක්ෂ්‍ය දෙස ස්ථානගත ගමන් කිරීමක් මගිනි.
   5. නිෂ්පාදන ස්ථානය මුල ලක්ෂ්‍ය දෙස ස්ථානයක සිට වක්‍රය දෙසට ගමන් කිරීමක් මගිනි.

21. පහත දැක්වෙන්නේ X සහ Y භාණ්ඩ නිෂ්පාදනය කරන ආර්ථිකයක දත්ත සමහරකි.

| X භාණ්ඩය | Y භාණ්ඩය |
|---|---|
| 0 | 250 |
| 10 | 230 |
| 20 | 200 |
| 30 | 130 |
| 40 | 0 |

මෙම ආර්ථිකයේ X නිෂ්පාදනය ඒකක 20 සිට 30 දක්වා වැඩි කිරීමේ ආවස්ථික පිරිවැය කොපමණ වේද?

1. Y ඒකක 200 කි.
2. Y ඒකක 130 කි.
3. Y ඒකක 10 කි.
4. Y ඒකක 7 කි.
5. Y ඒකක 70 කි.

22. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත සෑම ලක්ෂ්‍යකදීම අපේක්ෂා කළහැකි තත්ත්වයක් වන්නේ,
1. නිෂ්පාදිතය සාධාරණව බෙදී යාමයි.
2. මිල ස්ථායිතාවයි.
3. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවයි.
4. ආර්ථික කාර්යක්ෂමතාවයි
5. සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාවයි.

23. නිෂ්පාදන හැකියා වක්‍රයක් දකුණට විතැන්වීම සඳහා බලපාන සාධකයක් වන්නේ,
1. සාධක ඵලදායිතාවය ඉහළ යාමයි.
2. සේවා නියුක්තිය ඉහළ යාමයි
3. සේවා වියුක්තිය ඉහළ යාමයි
4. බාහිර ශුද්ධ සංක්‍රමණ ඉහළ යාමයි.
5. ආර්ථික පසුබැසීම ඉහළ යාමයි.

24. නිෂ්පාදන හැකියා වක්‍රයක් නිර්මාණය කිරීමේ උපකල්පනයක් නොවන්නේ,
1. භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිපදවීම
2. ආර්ථිකය සතු සම්පත් සම්භාරය ස්ථාවරවීම
3. අදාළ කාලය තුළ තාක්ෂණය නොවෙනස්ව පැවතීම
4. සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවකින් උපයෝජනය කිරීම
5. සම්පත් උපයෝජන සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

25. නිෂ්පාදන හැකියා වක්‍රයක බෑවුම මගින් නිරූපනය කරන්නේ,
1. ආවස්ථික පිරිවැයයි.
2. ආන්තික පිරිවැයයි
3. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවයි
4. නිෂ්පාදනයේ අකාර්යක්ෂමතාවයයි
5. සම්පත් වල පළදායිතාවය ඉහළයාමයි.


26. ඉල්ලුම් නීතිය ලෙස හඳුන්වනුයේ,
1. භාණ්ඩයක මිල ඉහළ හෝ පහළ යන විට එම භාණ්ඩයේ ඉල්ලුම ඉහළ හෝ පහළ යාමයි.
2. ඉල්ලුම කෙරෙහි බලපාන මිල හැර අනෙකුත් සාධක වෙනස්වීම නිසා භාණ්ඩයක ඉල්ලුම වෙනස්වීමයි.
3. භාණ්ඩයක මිල ඉහළ හෝ පහළ යන විට භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය පහළ හෝ ඉහළ යාමයි.
4. භාණ්ඩයක මිල වෙනස්වන විට ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීමයි.
5. භාණ්ඩයක මිල හැර අන් සාධක වලට පාරිභෝගිකයා ප්‍රතිචාර දැක්වීමයි.

27. කිසියම් භාණ්ඩයක ඉල්ලුම වැඩිවීම සඳහා බලපෑහැකි සාධකය වනුයේ,
1. භාණ්ඩය බාල භාණ්ඩයක් නම් ආදායම ඉහළයාම
2. භාණ්ඩයේ මිල පහළ යාම
3. භාණ්ඩයේ මිල ඉහළ යාම
4. ආදේශන භාණ්ඩ මිල ඉහළයාම
5. අනුපූරක භාණ්ඩ මිල ඉහළ යාම

28. සීනි සහ හකුරු ආදේශන භාණ්ඩ වේ. සීනි මිල ඉහළ ගිය බව උපකල්පනය කරන්න එහි ප්‍රතිඵලයක් ලෙස හකුරු ඉල්ලුම පිළිබඳව එළැඹිය හැකි නිගමනය වන්නේ,
1. හකුරු ඉල්ලුම වැඩිවේ
2. හකුරු ඉල්ලුම අඩුවේ
3. හකුරු ඉල්ලුම් වක්‍රය වමට විතැන්වේ.
4. හකුරු ඉල්ලුමට කිසිදු බලපෑමක් ඇතිනොවේ.
5. හකුරු ඉල්ලුම් ප්‍රමාණය අඩුවේ.


29. පාන් සඳහා ඉල්ලුම් නම්‍යතාවය - 0.4 ක් ලෙස සලකන්න. නිෂ්පාදකයින් විසින් පාන් මිල 50% කින් අඩුකළේනම් පාන් ඉල්ලුම් කරන ප්‍රමාණය කොපමණ ප්‍රමාණයකින් අඩු හෝ වැඩි වේද?
1. 20% කින් ඉහළ යයි 2. 30% කින් පහල යයි 3. 30% කින් පහළ යයි
4. 20% කින් පහළ යයි 5. 10% කින් ඉහළ යයි.

30. පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයකට අදාළ ඉල්ලුම් වක්‍රයකි. එයට අදාළ ඉල්ලුම් සමීකරණය වන්නේ,




1. $Qd = 500 - 200P$
2. $Qd = 500 - 20P$
3. $Qd = 500 - 2.5P$ .
4. $Qd = 500 - 2P$
5. $Qd = 500 - 0.4P$


31. පහත දැක්වෙන ඉල්ලුම් වක්‍රයට අදාළ භාණ්ඩ වර්ගය වන්නේ,




1. ආදේශක භාණ්ඩයකි
2. අනුපූරක භාණ්ඩයකි
3. බාල භාණ්ඩයකි
4. ගිෆන් භාණ්ඩයකි
5. සුඛෝපභෝගී භාණ්ඩයකි

32. කිසියම් භාණ්ඩයක ආදායම් ඉල්ලුම් නම්‍යතාව 2.5 ක් ලෙස ගණනය කර ඇත. මෙම භාණ්ඩය කුමන භාණ්ඩයක් විය හැකිද?
1. බාල භාණ්ඩයක් විය හැකිය. 2. අත්‍යාවශ්‍ය භාණ්ඩයක් වියහැකිය.
3. සුඛෝපභෝගි භාණ්ඩයක් විය හැකිය. 4. ගිෆන් භාණ්ඩයක් විය හැකිය.
5. ආදේශක භාණ්ඩයක් විය හැකිය.

33. පහත දැක්වෙන්නේ අන්නාසි සඳහා වන ඉල්ලුම් වක්‍රයකි.




මෙම ඉල්ලුම් වක්‍රයේ ඉෑවුම සහ බෑවුමේ පරස්පරය නිවැරදිව දැක්වෙන පිළිතුර හඳුනාගන්න.

| | බෑවුම | බෑවුමේ පරස්පරය |
|---|---|---|
| 1. | 5 | 0.2 |
| 2. | 0.4 | 5 |
| 3. | 0.2 | 4 |
| 4. | 0.2 | 5 |
| 5. | 50 | 10 |

34. $Qd = 300 - 10P$ නැමති සමීකරණයට අදාළ භාණ්ඩයේ මිල 20 කදී ඉල්ලුම් නම්‍යතාවය වනුයේ,
1. $PED = 2$ 2. $PED = 0.5$ 3. $PED = 4.0$ .
4. $PED = -0.5$ 5. $PED = -2$

35. කිසියම් භාණ්ඩයක පාරිභෝගික පැහැදම උපරිම වන්නේ එම භාණ්ඩයේ නම්‍යතාවය,
1. නම්‍ය වන විටය 2. ඒකීය වන විටය 3. අනම්‍ය වන විටය
4. පූර්ණ නම්‍ය වන විටය 5. පූර්ණ අනම්‍ය වන විටය

36. ජංගම දුරකතන සඳහා මිල ඉල්ලුම් නම්‍යතාව නම්‍ය යැයි සලකන්න. ජංගම දුරකථන මිල ඉහළ ගියේ නම් පාරිභෝගික වියදම කෙසේ වෙනස්වේද?
    1. උපරිම වේ.    2. ඉහළ හෝ පහළ යයි.    3. නොවෙනස්ව පවතී
    4. ඉහළ යයි    5. පහළ යයි.

37. පුද්ගලයකුගේ ආදායම රුපියල් 20000 ක සිට 25000 දක්වා ඉහළ යන විට මාගරින් සඳහා වන ඉල්ලුම් ප්‍රමාණය 200 ක සිට 180 දක්වා පහළ ගියේ නම්, මෙම භාණ්ඩ වර්ගය සහ එහි ආදායම නම්‍යතාවය වන්නේ,

| | **භාණ්ඩ වර්ගය** | **නම්‍යතාවය** |
|---|---|---|
| 1. | සාමාන්‍ය භාණ්ඩ | 2.5 |
| 2. | ගිෆන් භාණ්ඩ | 4.0 |
| 3. | බාල භාණ්ඩ | -0.4 |
| 4. | අත්‍යාවශ්‍ය භාණ්ඩ | 2.5 |
| 5. | සුඛෝපභෝගී භාණ්ඩ | 0.4 |

38. සලකා බලන භාණ්ඩයක මිල වැඩිවීමකදී එහි ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමට බලපාන ආදායම් ප්‍රතිවිපාකය වන්නේ,
    1. සාපේක්ෂ මිල අඩු භාණ්ඩ වෙතට පාරිභෝගිකයා මාරු වීමයි.
    2. භාණ්ඩයේ මිල වැඩිවීමකදී මූල්‍ය ආදායම අඩුවීමයි.
    3. භාණ්ඩයේ මිල වැඩිවීමකදී මූර්ත ආදායම පහළයාමයි.
    4. භාණ්ඩයේ මිල වැඩිවීමකදී මූර්ත ආදායම ඉහළයාමයි.
    5. භාණ්ඩයේ අනාගත මිල ඉහළ යන බව උපකල්පනය කිරීමයි.

39. සැපයුම් වක්‍රයක් වමේ සිට දකුණට ඉහළට බෑවුම් වීම සඳහා බලපාන හේතුව වන්නේ,
    1. මිල ඉහළ යනවිට අයභාරය ඉහළ යාමයි.    2. මිල ඉහළ යනවිට ආදායම ඉහළ යාමයි.
    3. මිල ඉහළ යනවිට පිරිවැය පහළ යාමයි.    4. මිල ඉහළ යනවිට පාරිභෝගික පැතුම් ඉහළයාමයි.
    5. නිමවුම වැඩිවනවිට ආන්තික පිරිවැය ඉහළ යාමයි.

40. පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයකට අදාළ සැපයුම් සමීකරණයකි.
    $Qs = -200 + 5P$ මෙම භාණ්ඩයේ අවම සැපයුම් මිල වන්නේ,
    1. රුපියල් 20 කි    2. රුපියල් 30 කි    3. රුපියල් 40 කි
    4. රුපියල් 50 කි    5. රුපියල් 60 කි

41. පහත දැක්වෙන සැපයුම් සමීකරණයට අදාළ භාණ්ඩයේ රුපියල් 40 කදී සපයනු ලබන ප්‍රමාණය කොපමණද?
    $Qs = 500 + 10P$
    1. ඒකක 300 කි    2. ඒකක 50 කි    3. ඒකක 200 කි
    4. ඒකක 500 කි    5. ඒකක 100 කි


42. ආයතනයක් කිසියම් භාණ්ඩයක මිල 25% කින් පහළ දැමීමේ ප්‍රතිඵලයක් ලෙස එහි නිෂ්පාදන අයභාරය 15% කින් පහළ ගියේ නම් මෙම මිල පරාසය තුළ ආයතනය මුහුණදෙන ඉල්ලුම් වක්‍රය,
    1. නම්‍ය විය යුතුය    2. අනම්‍ය විය යුතුය.    3. පූර්ණ අනම්‍ය විය යුතුය.
    4. පූර්ණ නම්‍ය විය යුතුය    5. ඍජුකෝණාශ්‍රාකාර බහුවලයක් විය යුතුය.

43. කිසියම් භාණ්ඩ දෙකක් අනුපූරක භාණ්ඩ ලෙස සැලකිය හැකි වන්නේ පහත සඳහන් කවර ලක්ෂණයක් පදනම් කරගෙනද?
    1. ආදායම් නම්‍යතාව ඍණ අගයක් ගැනීම    2. හරස් මිල ඉල්ලුම් නම්‍යතාව අනම්‍ය වීම
    3. මිල ඉල්ලුම් නම්‍යතාවය ධන අගයක් ගැනීම    4. හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ධන අගයක් ගැනීම
    5. හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ඍණ අගයක් ගැනීම

44. කිසියම් භාණ්ඩයක සැපයුම වැඩිවී ඇතැයි උපකල්පනය කරන්න. ඒ සඳහා බලපෑහැකි සාධකයක් වනුයේ,
    1. භාණ්ඩය සඳහා පනවා තිබූ බදු පහළ යාම    2. භාණ්ඩය සඳහා ලබා දී ඇති සහනාධාර පහළ යාම
    3. යෙදවුම් මිල ඉහළ යාම    4. නිෂ්පාදකයින් සංඛ්‍යාව පහළ යාම
    5. භාණ්ඩයේ මිල ඉහළයාම

45. සැපයුම් නීතිය ලෙස නිර්වචනය කෙරෙන්නේ,
   1. මිල වැඩිවන විට සැපයුම වැඩිවීමයි.
   2. මිල හා සැපයුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයි
   3. මිල අඩුවන විට සැපයුම අඩුවීමයි
   4. මිල සහ සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවයි
   5. මිල අඩු හෝ වැඩිවන විට සැපයුම අඩු හෝ වැඩිවීමයි.

46. කිසියම් භාණ්ඩයකට අදාළ සැපයුම් වක්‍රයක් පහත දැක්වේ




මෙම සැපයුම් වක්‍රයට අදාළ සැපයුම් සමීකරණය හඳුනාගන්න.
   1. $Qs = -20 + 4P$
   2. $Qs = 200 + 0.25P$
   3. $Qs = 200 + 4P$
   4. $Qs = -200 + 4P$
   5. $Qs = -20 + 0.25P$

47. පහත දැක්වෙන්නේ ආයතන 3 කින් සමන්විත වෙළඳපොළක අන්නාසි සැපයුම්කරුවන් තිදෙනෙකු සැපයුම් සමීකරණ 3 කි.

$QSA = 20 + 2P$

$QSB = 30 + 2P$

$QSC = 50 + 2P$

මුළු වෙළඳපොළ සැපයුම් සමීකරණය වන්නේ,
   1. $Qs = -100 + 4P$
   2. $Qs = 100 + 6P$
   3. $Qs = 200 + 2P$
   4. $Qs = 100 + 2P$
   5. $Qs = 70 + 6P$

48. X නැමැති භාණ්ඩයේ මිල නොවෙනස්ව පැවති අතර සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව ඉහළ ගියේ නම් එළැඹිය හැකි නිගමනය වන්නේ,
   1. සැපයුම් ප්‍රමාණය පහළයයි.
   2. භාණ්ඩයේ මිල ඉහළ යයි.
   3. සැපයුම් වක්‍රය වමට විතැන්වේ.
   4. සැපයුම් ප්‍රමාණය නොවෙනස්ව පවතී.
   5. සමස්ත සැපයුම ඉහළයාමත් සිදුවේ.

49. සැපයුම තීරණය කරන සාධක වල අන් භාණ්ඩ මිල යනුවෙන් අදහස් වන්නේ,
   1. තම සම්පත් වලින් නිපදවිය හැකි වෙනත් භාණ්ඩ මිල වේ.
   2. ආදේශක හා අනුපූරක භාණ්ඩ මිල වේ.
   3. නිෂ්පාදන සාධක වල මිල වේ.
   4. තාක්ෂණික සාධක මිල ගණන් වේ.
   5. වෙනත් නිෂ්පාදකයන්ගේ භාණ්ඩ මිල වේ.

50. පහත දැක්වෙන්නේ භාණ්ඩයක මිල හා සැපයුම් ප්‍රමාණ දැක්වෙන ලේඛනයකි.

| **P** | **Qs** |
|---|---|
| 50 | 800 |
| 40 | 600 |
| 30 | 400 |

මෙම ලේඛනයට අදාළ සැපයුම් සමීකරණය වන්නේ,
   1. $Qs = 400 + 20P$
   2. $Qs = -100 + 20P$
   3. $Qs = -200 + 20P$
   4. $Qs = 200 + 10P$
   5. $Qs = 100 + 20P$

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S II

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................   ආර්ථික විද්‍යාව II   කාලය පැය තුනයි

❖ **"අ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## අ උප කොටස

01). i. යථානුරූපී ප්‍රකාශ (Positive Statement) සහ අභිමතානුරූපී ප්‍රකාශ (Normative Statement) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. අවශ්‍යතා හා වුමනා (Needs and Wants) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. ආර්ථික සම්පත් නිර්වචනය කර ඒවා වර්ගකර දක්වන්න. (ලකුණු 5)

iv. පහත සඳහන් දෑ කුමන නිෂ්පාදන සාධකයකට ඇතුළත් වේද යන්න සඳහන් කරන්න.

(අ) පොස්පේට් නිධියක්   (ආ) ධීවරයෙකු මාළු ඇල්ලීම

(ඇ) තේ වගාවක්   (ඈ) කොරල්පරයක් (ලකුණු 4)

v. ආර්ථික පද්ධති වර්ග කිරීමේ දී යොදාගන්නා නිර්ණායක මොනවාද? (ලකුණු 3)

02). i. ප්‍රාග්ධනය හා මානව ප්‍රාග්ධනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. හිඟකම යනුවෙන් කුමක් අදහස් වේද? රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. වැඩෙන ආවස්ථික පිරිවැය රූප සටහනක් යොදාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. වෙළඳපොල ආර්ථිකයක මූලික ලක්ෂණ 4 ක් නම් කරන්න. (ලකුණු 4)

v. වෙළඳපොල ආර්ථිකයක නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.(ලකුණු 4)

03). i. රටක මූලික ආර්ථික ප්‍රශ්න නම් කරන්න. (ලකුණු 3)

ii. ආවස්ථික පිරිවැය ශුන්‍ය වන අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 3)

iii. රූප සටහන් යොදාගනිමින් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව පැහැදිලි කරන්න. (ලකුණු 6)

iv. නිෂ්පාදන සම්පත්වල හිමිකාරිත්වය හා දේපොල අයිතිය මත ආර්ථික පද්ධති වෙන්කර දක්වන්න.(ලකුණු 4)

v. මිශ්‍ර ආර්ථික පද්ධතියක ලක්ෂණ මොනවාද? (ලකුණු 4)

04). i. ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ආර්ථික විද්‍යාවේ ''මුදල්'' ප්‍රාග්ධනය ලෙස නොසැලකිමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. පහත සඳහන් සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් රූප සටහන් ඇසුරින් පෙන්නුම් කරන්න.

(අ) සේවා වියුක්තිය වැඩිවීමක් (ආ) ආර්ථික වෘද්ධිය

(ඇ) ආර්ථික අවපාතය (ඈ) පූර්ණ සේවා නියුක්තිය (ලකුණු 4)

iv. ශ්‍රමය හා ව්‍යවසායකත්වය එකනෙකින් වෙනස් වේද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. සැලසුම් ආර්ථික පද්ධතියක මූලික ලක්‍ෂණ 4 ක් නම් කරන්න. (ලකුණු 4)

## <u>ආ උප කොටස</u>

**(මෙම කොටසෙන්ද අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)**

05). i. ඉල්ලුම් නීතිය යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 3)

ii. පෞද්ගලික ඉල්ලුම හා වෙළඳපොල ඉල්ලුම නිර්වචනය කරන්න. (ලකුණු 4)

iii. කිසියම් භාණ්ඩයක ඉල්ලුම සීඝ්‍රලෙස අඩුවී ඇතැයි නිගමනය කරන්න. ඒ සඳහා බලපෑ හැකි සාධක 5 ක් ලියන්න. (ලකුණු 5)

iv. කිසියම් භාණ්ඩයක මිල ඉහළ යන විට ඉල්ලුම් ප්‍රමාණ අඩු කරන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.(ලකුණු 4)

v. වමේ සිට දකුණට පහළට බෑවුම්වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයකට අදාළ පොදු සමීකරණය පැහැදිලි කරන්න. (ලකුණු 4)

06). i. ගිෆන් භාණ්ඩ යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? රූප සටහන් යොදාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. භාණ්ඩය ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීම හා ඉල්ලුමේ වෙනස්වීම අතර වෙනස පැහැදිලි කරන්න.(ලකුණු 4)

iii. මිල ඉල්ලුම් නම්‍යතාව නිර්වචනය කර එය මිණුම් කළ හැකි ක්‍රම දක්වන්න. (ලකුණු 4)

iv. මිල ඉල්ලුම් නම්‍යතා තීරක ගෙන හැර දක්වන්න. (ලකුණු 4)

v. ඉල්ලුම් නීතිය ඉදිපරිත් කිරීමේදී යොදා ගන්නා උපකල්පන දක්වන්න. (ලකුණු 4)

07). i. $Qdx = 600 - 10P$ යනු භාණ්ඩ වෙළඳපොලෙහි අලෙවි වන භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය නිරූපනය වන ඉල්ලුම් සමීකරණයකි.

(අ) ඉහත සමීකරණයට අදාළ ඉල්ලුම් වක්‍රය නිර්මාණය කරන්න.

(ආ) මෙම භාණ්ඩයේ වෙළඳපොල මිල රු. 40 දී මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න.

(ඇ) ඉහත සමීකරණය $Qdx = 800 - 10P$ ලෙස වෙනස් වූයේ නම් ඒ සඳහා බලපෑ හැකි සාධක 2 ක් සඳහන් කරන්න.

(ඈ) මෙම සමීකරණට අදාළ ඉල්ලුම් ලේඛනය ගොඩනගන්න. (ල. 2 බැගින් මුළු ල. 8 කි)

ii. නම්‍ය ඉල්ලුමකදී හා අනම්‍ය ඉල්ලුමකදී මිල ඉහළ යන විට පාරිභෝගික පැහැදම හැසිරෙන ආකාරය රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. ආදායම් ඉල්ලුම් නම්‍යතාව මත භාණ්ඩ වර්ග කර දක්වන්න. (ලකුණු 4)

iv. සාමාන බෑවුමකින් පහළ බසින ඉල්ලුම් වක්‍රයක නම්‍යතාව පිළිබඳ ඔබට කිවහැක්කේ කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

08). i. කිසියම් භාණ්ඩයක සැපයුම කෙරෙහි බලපාන මිල නොවන සාධක නම් කරන්න. (ලකුණු 4)

ii. සැපයුම් නීතිය නිර්වචනය කරන්න. (ලකුණු 4)

iii. සැපයුම් නීතියට වැඩිවන ආන්තික පිරිවැය නීතිය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. කිසියම් භාණ්ඩයක සැපයුම අඩුවීමට බලපාන සාධක 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

v. $Qs = +10P$ සමීකරණයට අදාළව සැපයුම් ලේඛනයක් සහිතව සැපයුම් වක්‍රයක් ඇඳ දක්වන්න.(ලකුණු 4)

# 2019 - පළමු වාර පරීක්ෂණය
# 12 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1) | 1 | 11) | 3 | 21) | 5 | 31) | 4 | 41) | 5 |
| 2) | 3 | 12) | 5 | 22) | 3 | 32) | 3 | 42) | 2 |
| 3) | 4 | 13) | 1 | 23) | 1 | 33) | 4 | 43) | 5 |
| 4) | 1 | 14) | 3 | 24) | 5 | 34) | 5 | 44) | 1 |
| 5) | 5 | 15) | 4 | 25) | 1 | 35) | 2 | 45) | 4 |
| 6) | 2 | 16) | 1 | 26) | 3 | 36) | 5 | 46) | 3 |
| 7) | 1 | 17) | 4 | 27) | 4 | 37) | 3 | 47) | 2 |
| 8) | 2 | 18) | 3 | 28) | 1 | 38) | 3 | 48) | 5 |
| 9) | 4 | 19) | 2 | 29) | 4 | 39) | 5 | 49) | 1 |
| 10) | 2 | 20) | 4 | 30) | 3 | 40) | 5 | 50) | 3 |

## II කොටස
### අ උප කොටස

**01). i. යථානුරූපී ප්‍රකාශ (Positive Statement) සහ අභිමතානුරූපී ප්‍රකාශ (Normative Statement) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**ii. අවශ්‍යතා හා වුමනා (Needs and Wants) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**iii. ආර්ථික සම්පත් නිර්වචනය කර ඒවා වර්ගකර දක්වන්න. (ලකුණු 5)**

**iv. පහත සඳහන් දෑ කුමන නිෂ්පාදන සාධකයකට ඇතුලත් වේවි යන්න සඳහන් කරන්න.**

**(අ) පොස්පේට් නිධියක් (ආ) ධීවරයෙකු මාළු ඇල්ලීම**

**(ඇ) තේ වගාවක් (ඊ) කොරල්පරයක් (ලකුණු 4)**

**v. ආර්ථික පද්ධති වර්ග කිරීමේ දී යොදාගන්නා නිර්ණායක මොනවාද? (ලකුණු 3)**

01). i. යථානුරූපී ප්‍රකාශ යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද , කුමක් වූයේද, කුමක් වනු ඇද්ද යන ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා යොමුවුණු ප්‍රකාශයන්ය.

- යථානුරූපී ප්‍රකාශ හරි හෝ වැරදිහෝ විය හැකිය. එබඳු ප්‍රකාශයක නිර්වද්‍යතාව ප්‍රත්‍යක්ෂමූල සාධක මගින් පරීක්ෂාවට ලක්කළ හැකිය. එබැවින් යථානුරූපී ප්‍රකාශ විද්‍යාත්මක ස්වරූපයක් ගනී. (ල.2)
- අභිමතානුරූපී ප්‍රකාශ යනුවෙන් අදහස් කරනුයේ කුමක් විය යුතුද? යන ප්‍රශ්නයට දෙන පිළිතුර හා යොමුවුණු ප්‍රකාශයන්ය. මෙබඳු ප්‍රකාශ පුද්ගල බද්ධ තාවයක් උසුලයි. එබැවින් මෙබඳු ප්‍රකාශ විෂය බද්ධ ආකාරයෙන් පරීක්ෂාකර බැලිය නොහැකිය. එබැවින් අභිමතානුරූපී ප්‍රකාශ විද්‍යාත්මක ස්වරූපයක් නොගනී. (ල.2)

ii.
- අවශ්‍යතා යනු අවම ජීවන තත්ත්වයක් පවත්වාගෙන යාම සඳහා පුද්ගලයකුට අවශ්‍ය අවම දෑය.
  උදා - ආහාර, ඇදුම්, නිවාස
- උවමනා යනු අවශ්‍යතා සපුරාගැනීමට යොදාගන්නා විවිධ ස්වරූපයන්ය.
  උදා - අවශ්‍යතාවය ආහාර වුවමනා බත්, පාන්, ඉදිආප්ප
- අවශ්‍යතා සරළවන අතර, වුවමනා සංකීර්ණ වේ.
- අවශ්‍යතා සීමිත වන අතර වුවමනා අසීමිත වේ. (ලකුණු 4)

iii.
- ආර්ථික සම්පත් යනු නිෂ්පාදන සම්පත් අතරින් සීමිත සැපයුමක් ඇති හිඟ සම්පත්ය. ආර්ථික සම්පත් හිඟකමක් සහිත බැවින් ඒවාට මිලක් සහ භාවිතයේදී ආවස්ථික පිරිවැයක් ද පවතී. (ල. 3)
- භූමිය - ශ්‍රමය - ප්‍රාග්ධනය - ව්‍යවසායකත්වය (ල. 2)

iv. (අ) භූමිය (ආ) ප්‍රාග්ධනය (ඇ) ශ්‍රමය (ඊ) භූමිය (ලකුණු 4)

v.
- තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය - සම්පත් හා දේපළ හිමිකාරිත්වය
- සානුබල වල ස්වරූපය (ලකුණු 3)

**02). i. ප්‍රාග්ධනය හා මානව ප්‍රාග්ධනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**ii. හිඟකම යනුවෙන් කුමක් අදහස් වේ? රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**iii. වැඩෙන ආවස්ථික පිරිවැය රූප සටහනක් යොදාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**iv. වෙළඳපොල ආර්ථිකයක මූලික ලක්ෂණ 4 ක් නම් කරන්න. (ලකුණු 4)**


**v. වෙළඳපොල ආර්ථිකයක නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.(ලකුණු 4)**

02). i. - ප්‍රාග්ධනය යනුවෙන් අදහස් වන්නේ මිනිසා විසින් නිෂ්පාදිත ක්ෂයවීමෙන් කෙළවරවන නැවත ප්‍රතිසම්පාදනය කළහැකි නිෂ්පාදන ආධාරකයන්ය. භාණ්ඩ හා නිෂ්පාදනය ක්‍රියාවලියට දායක කරගත හැකි ආධාරක මෙයට අයත් වේ. උදා - ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, දිගුකාලීන වගා, යටිතල පහසුකම් (ල.2)

- ශ්‍රම හමුදාව විසින් සමුච්චනය කරගනු ලැබූ දැනුම අධ්‍යාපනය පුහුණුවීම් සහ අත්දැකීම් තුලින් දැනුම කුසලතා වර්ධනය කරගැනීමේ ක්‍රියාවලිය ආර්ථික විද්‍යාඥයින් මානව ප්‍රාග්ධනය ලෙස හඳුන්වයි. (ල.2)

ii. - සම්පත් හිඟකම යනු අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සම්පත්වල පවත්නා ඌණතාවයයි. සම්පත් නැත යන්න මෙයින් අදහස් නොවේ.


- ධනවත් සහ දිළිඳු ඕනෑම රටකට සම්පත් හිඟකම පොදු ප්‍රශ්නයකි.
- මිනිස් වුවමනා අසීමිත වීමත් සම්පත් සීමා සහිත වීමත් නිසා සම්පත් හිඟකම පැන නගී. පහත රූප සටහන මගින් සම්පත් හිඟකම පෙන්නුම් කළ හැකිය. (ල.3)




(ල 1)

iii. - වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය යනු මායිම මත එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ප්‍රමාණයකින් වැඩි කරන විට අනෙක් භාණ්ඩයෙන් කැපකරන ප්‍රමාණය හෙවත් ආන්තික ආවස්ථික පිරිවැය දිගින් දිගටම ඉහළ යාමේ තත්ත්වයයි

- පහත රූප සටහන මගින් වැඩෙන ආවස්ථික පිවරිැය පෙන්නුම් කෙරේ. (ල. 2)




$\frac{\Delta y}{\Delta x}$ ආවස්ථික පිරිවැය වැඩිවේ.

| x | y | x ආ.පි |
|---|---|---|
| 0 | 25 | |
| 1 | 24 | 1 |
| 2 | 22 | 2 |
| 3 | 18 | 4 |
| 4 | 12 | 6 |
| 5 | 0 | 12 |

(ල.2)

iv. - දේපොල පිළිබඳ පෞද්ගලික හිමිකම - නිදහස් ව්‍යවසාය සහ නිදහස් තේරීම
- පාරිභෝගික ස්වාධිපත්‍යය - වෙළඳපොලවල් තරගකාරීවීම
- ස්වාර්ථය පදනම් කරගත් සානුබල පැවැත්ම - මිල යාන්ත්‍රණය
- ආණ්ඩුවේ කාර්යභාරය සීමා සහිත වීම (කරුණු 4 ට ල. 4)

v. - විකල්ප නිෂ්පාදන ශිල්පක්‍රම අතුරින් කුමන හෝ එක් ශිල්ප ක්‍රමයක් භාවිත කොට නිපදවීමක් සිදුවන නිසා කෙසේ නිපදවිය යුතුද යන ප්‍රශ්නය නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය ලෙස හැඳින්වේ.

- වෙළඳපොළ ආර්ථිකයක අඩුම පිරිවැය සහිත නිෂ්පාදන ශිල්ප ක්‍රමය භාවිතාකොට මෙම ප්‍රශ්නය විසඳාගනී. කාර්යක්ෂම ක්‍රම ශිල්ප තෝරා ගැනීමේදී මිල යාන්ත්‍රණය මග පෙන්වනු ලැබේ. (ල.2)
- නිෂ්පාදන ක්‍රම ශිල්ප සැලසුම් ආර්ථිකයක් තීරණය කරනු ලබන්නේ සැලසුම් අධිකාරිය මගිනි. ඒ සඳහා පූර්ණ විස්තරයක් සපයා ගැනීමට සැලසුම් අධිකාරියට සිදුවේ. (ල.2)

**03). i. රටක මූලික ආර්ථික ප්‍රශ්න නම් කරන්න. (ලකුණු 3)**

**ii. ආවස්ථික පිරිවැය ශූන්‍ය වන අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 3)**

**iii. රූප සටහන් යොදාගනිමින් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව පැහැදිලි කරන්න.(ල.6)**


**iv. නිෂ්පාදන සම්පත්වල හිමිකාරිත්වය හා දේපොල අයිතිය මත ආර්ථික පද්ධති වෙන්කර දක්වන්න.(ලකුණු 4)**

**v. මිශ්‍ර ආර්ථික පද්ධතියක ලක්ෂණ මොනවාද? (ලකුණු 4)**

03). i. -කුමක් කොපමණ නිපදවනවාද - කෙසේ නිෂ්පාදනය කළ යුතුද - කා සඳහා නිෂ්පාදනය කළ යුතුද(ල. 3)

ii. - නොමිල භාණ්ඩ තිබීම. උදා - හිරුඑළිය, වාතය
- එක් භාවිතයකට පමණක් යොදා ගැනෙන භාණ්ඩ හෝ සම්පත් තිබීම
-පොදුවේ විරැකියා තත්ත්වයක් තිබීම (ලකුණු 3)

iii.




(ල.2)

(ල.2)

$B$ ලක්ෂයේදී $MB = MC$ නිසා එම ලක්ෂ්‍යයේදී නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාවය ඉටුවේ. (ල.2)

(මුළු ලකුණු 06)

iv. - ධනේශ්වර ආර්ථික පද්ධති (ල. 2) - සමාජවාදී ආර්ථික පද්ධති .(ල2)


v. - ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරී අංශ වන්නේ පාරිභෝගිකයින්, නිෂ්පාදකින් සහ සම්පත් හිමිකරුවන් සහ ආණ්ඩුව වීම
- ස්වාර්ථය හා පොදු සුභසාධනය සානුබල ලෙස ක්‍රියාත්මක වීම.
- නිෂ්පාදන සම්පත් පෞද්ගලික අංශය සහ පොදු අංශය සතුවීම.
- සැලසුම් යාන්ත්‍රණය හා මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක වීම
- ආණ්ඩුව ආර්ථිකය තුළ වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීම (කරුණු 4 ට ලකුණු 4)

**04). i. ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**ii. ආර්ථික විද්‍යාවේ "මුදල්" ප්‍රාග්ධනය ලෙස නොසැලකිමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 3)**
**iii. පහත සඳහන් සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් රූප සටහන් ඇසුරින් පෙන්නුම් කරන්න.**
**(අ) සේවා වියුක්තිය වැඩිවීමක් (ආ) ආර්ථික වෘද්ධිය**
**(ඇ) ආර්ථික අවපාතය (ඈ) පූර්ණ සේවා නියුක්තිය (ලකුණු 4)**
**iv. ශ්‍රමය හා ව්‍යවසායකත්වය එකනෙකින් වෙනස් වේද? පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**v. සැලසුම් ආර්ථික පද්ධතියක මූලික ලක්ෂණ 4 ක් නම් කරන්න. (ලකුණු 4)**

04). i. - ආර්ථික භාණ්ඩ යනුවෙන් අදහස් වන්නේ පුද්ගලයකු හේ ආයතනයක් විසින් ගනු ලැබූ තීරණයක ප්‍රතිඵලයක් ලෙස බිහි වූභාණ්ඩ වේ. නිෂ්පාදන සම්පත් යොදා නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා ආර්ථික භාණ්ඩ යටතට ගැනේ. උදා - පරිගණකයක්, රූපවාහිනී යන්ත්‍රයක් (ල. 2)
- ආර්ථික නොවන භාණ්ඩ යනු පුද්ගලයකු හෝ ආයතනයක් හෝ මැදිහත් වීමකින් තොරව නිෂ්පාදන ක්‍රියාවලියක් නොමැතිව ශුන්‍ය මිලකදී අසීමිත සැපයුමක් පහත භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ යටතට ගැනේ. (ලකුණු 2)

ii. - ප්‍රාග්ධනය යනු මිනිසාවිසින් නිෂ්පාදිත නිෂ්පාදන ආධාරක වේ. මේවා මගින් නිෂ්පාදන ක්‍රියාවලියක් සිදුවේ. එහෙත් මුදල් යනු භාණ්ඩ හා සේවා හුවමාරුවේදී අතරමැදි ද්‍රව්‍යයක් ලෙස පොදුවේ සමාජයක් විසින් පිළිගනු ලබන ඕනෑම දෙයකි. (ල.1)
- මුදල් මගින් නිෂ්පාදනය කළ නොහැකි අතර, නිෂ්පාදිත භාණ්ඩ මිලදී ගත හැකිය. එබැවින් මුදල් ප්‍රාග්ධනයට අයත් නොවේ. (ල. 1)
- මුදල් මගින් ප්‍රාග්ධන වත්කම් මිලදී ගත හැකි වුවද නිෂ්පාදනය කළ නොහැකිය. (ලකුණු 1)

iii.




(ලකුණු 4)

iv. - නිෂ්පාදන සම්පත් සංකලනය කරමින් නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම මෙයෙවීම සහ අවදානම් දරමින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ව්‍යවසායකත්වය ලෙස හැඳින්වේ. (ල. 1)
උදා- පුද්ගලයකු ලී බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම (ල.1)
- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා ශ්‍රමිකයා විසින් යොදන කායික හා මානසික ශක්තිය ශ්‍රමය ලෙස හැඳින්වේ. උදා -ධීවරයෙකු මාළුන් ඇල්ලීම (ල.1)
- ව්‍යවසායකත්වයට ලාබ ලැබෙන අතර, ශ්‍රමිකයාට ලැබෙනුයේ වැටුප්ය. මව්‍යවසායකයා අවදානම් දරණ අතර ශ්‍රමිකයා අවදානම් නොදරයි. (ල. 1) (මුළු ලකුණු 5)

v. - ශ්‍රමය හැර අනෙකුත් නිෂ්පාදන සම්පත් රජය සතුවීම.
- මූලික ආර්ථික ප්‍රශ්න සැලසුම් ක්‍රියාවලිය මගින් විසඳීම
- පොදු ශුභ සාධනය සානුබලයත්වීම.
- රජය, සැලසුම් අධිකාරිය ව්‍යවසාය කම්කරුවන් හා පාරිභෝගිකයන් යන ඒකක කටයුතු කිරීම (ල. 4)

**<u>ආ උප කොටස</u>**
**(මෙම කොටසෙන්ද අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)**

**05). i. ඉල්ලුම් නීතිය යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 3)**
**ii. පෞද්ගලික ඉල්ලුම හා වෙළඳපොල ඉල්ලුම් හා වෙළඳපොල ඉල්ලුම් නිර්වචනය කරන්න. (ලකුණු 4)**
**iii. කිසියම් භාණ්ඩයක ඉල්ලුම සීඝ්‍රලෙස අඩුවී ඇතැයි නිගමනය කරන්න. ඒ සඳහා බලපෑ හැකි සාධක 5 ක් ලියන්න.(ලකුණු 5)**
**iv. කිසියම් භාණ්ඩයක මිල ඉහළ යන විට ඉල්ලුම් ප්‍රමාණ අඩු කරන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**v. වමේ සිට දකුණට පහළට බෑවුම්වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයකට අදාළ පොදු සමීකරණය පැහැදිලි කරන්න. (ලකුණු 4)**

05). i. ඉල්ලුම් නීතිය යනු ඉල්ලුම් කෙරෙහි බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී භාණ්ඩයක මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර පවතින ප්‍රතිලෝම හෙවත් ඍණ සම්බන්ධතාවයකි. (ලකුණු 3)

ii. - නිශ්චිත කාලයක් තුලදී වෙළෙඳපොලේ සිටින එක් ගැනුම් කරුවකු විසින් සලකා භාණ්ඩයට පවත්නා විකල්ප මිල ගණන් යටතේ මිලදී ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණ පෞද්ගලික ඉල්ලුම ලෙස හැඳින්වේ.
- නිශ්චිත කාලයක් තුලදී වෙළෙඳපොලේ සිටින සියලුම ගැනුම්කවරුන් විසින් සලකාබලන භාණ්ඩය සඳහා පවත්නා විකල්ප මිල ගණන් යටතේ මිලදී ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණ වල එකතුව (වෙළඳපොල ඉල්ලුම) ලෙස හැඳින්වේ. (ලකුණු 4)

iii. - ආදේශන භාණ්ඩ මිල පහළ යාම - අනුපූරක භාණ්ඩ මිල ඉහළයාම
- බාල භාණ්ඩයක ආදායම ඉහළයාම - සුඛෝපභෝගී භාණ්ඩයක ආදායම පහළයාම
- පාරිභෝගික රුචිය පහළ යාම - පාරිභෝගික සංඛ්‍යාව පහළයාම (ලකුණු 5)

iv. කිසියම් භාණ්ඩයක මිල ඉහළ යන විට ඉල්ලුම් ප්‍රමාණය අඩු කරන්නේ පහත මිල ප්‍රතිවිපාකය සමන්විත වන උප ප්‍රතිවිපාක දෙක නිසාය.
1. මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය 2. මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය

**ආදේශන ප්‍රතිවිපාකය**
ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බන භාණ්ඩයේ මිල වැඩිවීම හේතු කොටගෙන එහි සාපේක්ෂ මිල වැඩි වී සලකා බලන භාණ්ඩය සඳහා වූ ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමයි. (ලකුණු 2)

**ආදායම් ප්‍රතිවිපාකය**
ගැණුම්කරුවන්ගේ මුදල් ආදායම ඇතුළු අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල වැඩිවීම හේතු කොටගෙන මූර්ථ ආදායම අඩුවී සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමයි. (ලකුණු 2)

v. $Qdx = a - bP$

$Qdx = x$ භාණ්ඩයේ මිල

$a = $ මිල 0 දී ඉල්ලන ප්‍රමාණය


$-b = Qd$ උක්තකල ඉල්ලුම් වක්‍රයක බෑවුම $\left(\frac{\Delta Q}{\Delta P}\right)$

$P = $ භාණ්ඩයේ මිල (ලකුණු 4)

**06). i. ගිෆන් භාණ්ඩ යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? රූප සටහන් යොදාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**ii. භාණ්ඩය ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීම හා ඉල්ලුමේ වෙනස්වීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**iii. මිල ඉල්ලුම් නම්‍යතාව නිර්වචනය කර එය මිණුම් කළ හැකි ක්‍රම දක්වන්න. (ලකුණු 4)**
**iv. මිල ඉල්ලුම් නම්‍යතා තීරක ගෙන හැර දක්වන්න. (ලකුණු 4)**
**v. ඉල්ලුම් නීතිය ඉදිපරිත් කිරීමේදී යොදා ගන්නා උපකල්පන දක්වන්න. (ලකුණු 4)**

06). i. - ගිෆන් භාණ්ඩ යනු ඉල්ලුම කෙරේ බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබයදී භාණ්ඩයක මිල ඉහළ යන විට ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යන මිල පහළ යනවිට ඉල්ලුම් ප්‍රමාණය පහළ යන මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර අනුලෝම හෙවත් + සම්බන්ධයන් ඇති භාණ්ඩ වේ.
- ගිෆන් භාණ්ඩ වල මිල ඉල්ලුම් නම්‍යතාවය + අගයක් ගනී.
- සෑම ගිෆන් භාණ්ඩයක්ම බාල භාණ්ඩයක් වන අතර සෑම බාල භාණ්ඩයක්ම ගිෆන් භාණ්ඩයක් නොවේ. ගිෆන් භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට ඉහළට බෑවුම් වේ. එය පහත පරිදි පෙන්නුම් කළ හැකිය.
(පැහැදිලි කිරීමට ල. 3)

ගිෆන් භාණ්ඩ ඉල්ලුම් වක්‍රය (වක්‍රයට ල. 1)



ii. - සලකා බලන භාණ්ඩයේ මිල හැර අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී භාණ්ඩයේ මිල අඩුහෝ වැඩි වීමකට ප්‍රතිචාරීව එහි ඉල්ලුම් ප්‍රමාණය වැඩි හෝ අඩුවීම ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීම ලෙස හඳුන්වයි.
- අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී භාණ්ඩයේ මිල ඉහළ යනවිට ඉල්ලුම් ප්‍රමාණය පහළ යන අතර, එම බලපෑම නිසා වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය ඉහළට ගමන්කරයි. එය ඉල්ලුම් සංකෝචනය ලෙස හඳුන්වයි.
- මිල පහළ යන විට ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යයි. එම බලපෑම නිසා වක්‍රය මත ලක්ෂ්‍යය පහළට ගමන්කරයි. එය ඉල්ලුම් ප්‍රසාරණය ලෙස හඳුන්වයි. (ල. 2)
- සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබියදී ඉල්ලුම කෙරේ බලපාලන අනෙකුත් සාධක වෙනස්වීම නිසා පැවැති මිල යටතේම ඉල්ලුම ඉහළ ගොස් ඉල්ලුම් වක්‍රය දකුණු පසට විතැන්වීම ඉල්ලුම වැඩිවීම ලෙස හඳුන්වයි.
- සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබිය දී ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක වෙනස්වීම නිසා පැවැති මිල යටතේම ඉල්ලුම පහළ ගොස් ඉල්ලුම් වක්‍රය වම්පසට විතැන්වීම ඉල්ලුමේ අඩුවීම ලෙස හඳුන්වයි.
- මේ අනුව ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීම වක්‍රය මත ගමන් කරන සංකල්පයක් වන අතර, ඉල්ලුම වෙනස්වීම ඉල්ලුම් වක්‍රය වමට හෝ දකුණට විතැන්වීමේ සංකල්පයකි. (ල.2)

iii. - මිල ඉල්ලුම් නම්‍යතාවය යනු ඉල්ලුම කෙරේ බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී කිසියම් භාණ්ඩයක මිලේ සිදුවන ප්‍රතිශතක වෙනසකට සාපේක්ෂව ඉල්ලුම් ප්‍රමාණයේ සිදුවන ප්‍රතිශතක වෙනස සංඛ්‍යාත්මකව මැන දැක්වීමයි.
- එය ලක්ෂ්‍ය මිල නම්‍යතා ක්‍රමයට හෝ චාප මිල නම්‍යතා ක්‍රමයට මැන දක්වනු ලබයි. (ල. 2)

උදා - ලක්ෂ්‍ය මිල ඉල්ලුම් නම්‍යතාවය

$$EdP = \frac{\Delta Q}{\Delta P} x \frac{P}{Q}$$ (ල.1)

චාප මිල ඉල්ලුම් නම්‍යතාවය

$$EdP = \frac{\Delta Q}{\Delta P} x \frac{P_1 + P_2}{Q_1 + Q_2}$$ (ල.1)

iv. - භාණ්ඩයකට ඇති ආදේශන සංඛ්‍යාව
- භාණ්ඩයෙන් ඇති ප්‍රයෝජන සංඛ්‍යාව
- භාණ්ඩයේ ස්වරූපය
- භාණ්ඩය නිර්වචනය කර ඇති ආකාරය
- භාණ්ඩයේ ප්‍රයෝජන සංඛ්‍යාව
- මිල වෙනස්වීමෙන් පසු ගත වූ කාලය

(කරුණු 4 සඳහ ල. 4)

v. - නිශ්චිත අවස්ථාවක මිල හා ඉල්ලුම් ප්‍රමාණය සැලකිල්ලට ගැනීම
- මිල හැර අනෙකුත් සාධක නොවෙනස්ව පැවතීම
- සාමාන්‍ය භාණ්ඩයක් සැලකිල්ලට ගැනීම
- තාර්කික ගැනුම්කරුවන්ගේ හැසිරීම සැලකිල්ලට ගැනීම (ලකුණු 4)

**07). i.** $Qdx = 600 - 10P$ **යනු භාණ්ඩ වෙළඳපොලෙහි අලෙවි වන භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය නිරූපනය වන ඉල්ලුම් සමීකරණයකි.**

**(අ) ඉහත සමීකරණයට අදාළ ඉල්ලුම් වක්‍රය නිර්මාණය කරන්න.**

**(ආ) මෙම භාණ්ඩයේ වෙළඳපොල මිල රු. 40 දී මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න.**

**(ඇ) ඉහත සමීකරණය** $Qdx = 800 - 10P$ **ලෙස වෙනස් වූයේ නම් ඒ සඳහා බලපෑ හැකි සාධක 2 ක් සඳහන් කරන්න.**


**(ඈ) මෙම සමීකරණට අදාළ ඉල්ලුම් ලේඛනය ගොඩනගන්න. (ල. 2 බැගින් මුළු ල. 8 කි)**

**ii. නම්‍ය ඉල්ලුමකදී හා අනම්‍ය ඉල්ලුමකදී මිල ඉහළ යන විට පාරිභෝගික පැහැදම හැසිරෙන ආකාරය එක් රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**iii. ආදායම් ඉල්ලුම් නම්‍යතාව මත භාණ්ඩ වර්ග කර දක්වන්න. (ලකුණු 4)**

**iv. සාමාන බෑවුමකින් පහළ බසින ඉල්ලුම් වක්‍රයක නම්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 4)**

07). i. (අ)




(ල.2)

(ආ) $EdP = b\ x \frac{P}{Q}$

$EdP = -10x \frac{40}{200}$

$EdP = -2$

$Qd = 600 - 10P$

$600 - 10x40$

$600 - 400$

$Qd = 200$


(ල.2)

(ඇ) - ආදේශක මිල ඉහළ යාම
- අනුපූරන මිල පහළ යාම
- සුඛෝපභෝගී භාණ්ඩ නම් ආදායම ඉහළයම
- බාල භාණ්ඩයක නම් ආදායම පහළ යාම
- පාරිභෝගික රුචිය ඉහළයාම (කරුණු 2 ක් සඳහා 2)

(ඈ) (නිවැරදි ලේඛනයට ල. 2)

| P | Qdx |
|---|---|
| 0 | 800 |
| 20 | 600 |
| 40 | 400 |
| 60 | 200 |
| 80 | 0 |

ii.





(ල.2)

- අනම්‍ය ඉල්ලුමකදී මිල ඉහළ යනවිට පැහැදම ද ඉහළ යයි
- නම්‍ය ඉල්ලුමකදී මිල ඉහළ යන විට පැහැදම පහළ යයි.


(ල. 2)

iii.




(ලකුණු 4)

iv.




(ල.2)

| | |
|---|---|
| $PEd = 0$ | පූර්ණ අනම්‍ය ඉල්ලුම |
| $PEd < -1$ | අනම්‍ය ඉල්ලුම |
| $PEd = 1$ | ඒකීය ඉල්ලුම |
| $PEd > -1$ | නම්‍ය ඉල්ලුම |
| $PEd = \propto$ | පූර්ණ අනම්‍ය ඉල්ලුම (ල.2) |

**08). i. කිසියම් භාණ්ඩයක සැපයුම කෙරෙහි බලපාන මිල නොවන සාධක නම් කරන්න. (ලකුණු 4)**

**ii. සැපයුම් නීතිය නිර්වචනය කරන්න. (ලකුණු 4)**

**iii. සැපයුම් නීතියට වැඩිවන ආන්තික පිරිවැය නීතිය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**iv. කිසියම් භාණ්ඩයක සැපයුම අඩුවීමට බලපාන සාධක 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)**

**v. $Qs = {}^{+}10P$ සමීකරණයට අදාළව සැපයුම් ලේඛනයක් සහිතව සැපයුම් වක්‍රයක් ඇඳ දක්වන්න.(ලකුණු 4)**

08). i. - යෙදවුම් මිල ගණන් - තාක්ෂණය - සම්බන්ධිත භාණ්ඩ මිල ගණන්
- නිෂ්පාදකයාගේ අපේක්ෂාව - නිෂ්පාදන සංඛ්‍යාව - රජයේ ප්‍රතිපත්ති (කරුණු 4 ට ල. 4)

ii. සැපයුම් නීතිය යනු සැපයුම කෙරේ බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී භාණ්ඩයක මිල ඉහළ යනවිට සැපයුම් ප්‍රමාණය ඉහළ යාමත් මිල පහළ යනවිට සැපයුම් ප්‍රමාණය පහළ යාමත් යන මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම හෙවත් + සම්බන්ධතාවයයි. (ලකුණු 4)


iii. - කිසියම් භාණ්ඩයක් වැඩියෙන් නිෂ්පාදනය කරන විට එහි ආවස්ථික පිරිවැයද ඉහළ යන බව වැඩිවන ආන්තික පිරිවැය නීතියෙන් කියවේ. නිමවුම වැඩිවන විට ආන්තික පිරිවැයද ඉහළ නගින බැවින් සිය නිෂ්පාදනය වැය කිරීමට නිෂ්පාදනයන් පෙළඹෙනුයේ වැඩිවන ආන්තික පිරිවැය පියවා ගැනීමට හැකිවන පරිදි භාණ්ඩයේ මිල ඉහළ නගිනවානම් පමණි. (ල.4)

iv. - යෙදවූ මිල ඉහළ යාම - රජය විසින් බදු පැනවීම
- සහනාධාර කපාහැරීම - සැපයුම්කරුවන් අඩුවීම (ලකුණු 4)

v.

| -P | Qs |
|---|---|
| 0 | 0 |
| 10 | 100 |
| 20 | 200 |
| 30 | 300 |
| 40 | 400 |
| 50 | 500 |

(නිවැරදි ලේඛනය ල.2)




(නිවැරදි ප්‍රස්ථාරයට ල. 2)